# ආහාර සටහන

## ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් දිවයින පුරා බෙදා හැරීමේ මහා සංවිධානයේ විත්ති

ආහාර පිළිබඳ අමාත්‍යාංශයේ තොරතුරු කියන්නට සැරසෙමු. සමුපකාර දෙපාර්තමේන්තුව මගින් රටවැසියාට ආහාර බෙදා දීමෙන් කරන ලද දැනට කරන්නාවූ සේවය පිළිබඳ තොරතුරු කවුරුත් දනිති. දැන් කියන්නේ, රට පුරා බෙදා දීම සඳහා එම දෙපාර්තමේන්තුවට සහල් සහ අනිකුත් ආහාර ද්‍රව්‍ය ලබාදෙන්නාවූ-පිට රටින් ගෙන්වා දෙන්නාවූ-ආහාර කොමසාරිස් තැනගේ දෙපාර්තමේන්තුවෙන් කෙරෙන සේවය ගැන යි. එහෙත් ඊට පළමු කිය යුත්තක් වෙයි.

අපි සමුපකාර ක්‍රමයට ශත විසි පහ ගණනේ ගෙවා හාල් ගන්නෙමු. එසේම සත 23 ගණනේ ගෙවා පිටි ගන්නෙමු. අප දන්නේ මෙපමණකි. නමුත් ඔබටත් අපටත් මෙසේ ශත විසි පහට ලැබෙන සහල් සේරුවටත්, සත 23 ට ලැබෙන පිටි රාත්තලටත්, ඔබේ අපේ ආණ්ඩුව කොයි තරම් වියදම් කරන්නේද? යන්න ගැන ඔබ සිතා බැලුවේ හෝ නොවේ ද? මෙය සිතා බැලිය යුතු සලකා බැලිය යුතු කාරණයකි. ඔබට අලුතෙන් ලැබුණු සහල් කූපන් පොතේ පිටි පස්සා පැත්තේ කවරය දෙස බලනු මැනවි, කාරණය එහි කියා ඇති. ඇත්ත, ඇත්ත වශයෙන් ම එහි සඳහන් වී ඇති.

ඔබත් අපත් සත 25 ක් දී ගන්නා හාල් සේරුවට අපේ ආණ්ඩුව සත 58 ක් ගෙවයි. ඔබත් අපත් සත 23 ක් දී ගන්නා පිටි රාත්තලට අපේ ආණ්ඩුව සත 25 ක් ගෙවයි. මේ තරම් සහල් අග හිඟයක් මුළු ලෝකයටම දැනෙන්නට පෙනෙන්නට සිදුවී තිබෙන මේ කාලයේ මේ තරම් පහසුවෙන් ඔබට සහල් පිටි ගන්නට-කන්නට-පුළුවන් වී තිබෙන්නේ, රජය කාගෙවත් නොදැනී නොපෙනී කරන්නාවූ මෙන්න මේ පුංචි උදවුව නිසා ය. පුංචි උදවුවක් නොවේ-ඇත්ත වශයෙන් ම මෙය ඉතා ඉහළ පෙළේ උදවුවකි. අපේ රජය අපේ ආහාරය සඳහා දිනපතා-සතිපතා- මාස් පතා- ඔව් අවුරුදු පතා-රුපියල් කෝටි ගණනක් වියදම් කරන්නේ ය.

මේ මුදල වනාහි ලංකාවේ මුළු මහත් ආදායමෙන් පහෙන් පංගුවකි. සිය රට වැසියා සාගින්නේ රත් නොකරවනු සඳහා වර්තමාන ආණ්ඩුව අවුරුදු පතා මේ සා විශාල ධනයක් වියදම් කරන බව ඔබත් මාත් අප හැම දෙනාත් විසින් ම විශේෂයෙන් දැනගෙන සිටිය මනා ය.

දැන් අපි දෙපාර්තමේන්තුවේ තොරතුරුවලට බසිමු. මේ දෙපාර්තමේන්තුවෙන් දැනට කෙරෙන ප්‍රධාන වැඩ කටයුතු සතරක් වෙයි එනම්:-

(1) පිට රටින් හාල් පිටි සීනි හා කිරි ආහාර ගෙනීම,

(2) සීනි සහ පිටි බෙදා හැරීම,

(3) පාසැල් යන ළමයින්ට කිරි බෙදා හැරීම, සහ

(4) මෙරට ගොවි ද්‍රව්‍යවලට ස්ථිර මිල නියමයක් අනුව ගෙවා මේ වැඩ කට යුතු සංවිධානය කිරීම ද, වේ.

මෙයින් පසුව කී කාරණය වනාහි මේ දෙපාර්තමේන්තුව මගින් 1950 දී පටන් ගන්නා ලද අලුත්ම කාර්යය යි.

අලුත් ම කාර්ය බූමාට මොකද, ගම්බද ජනයාගේ පොදු ජීවිතයත්, ඔවුන්ගේ ගොවිතැන් දියුණුවත් සම්බන්ධයෙන් සලකා බලන විට මෙය ඉතාම වැදගත් වැඩක් බව නොකියා හැක. කවර නිසාද යත්? ගොවියා උපදවන නිපදවන බඩු භාණ්ඩ වලට නියමිත මිල නියමයක් ආණ්ඩුවේ මෙහෙයීමෙන් බල නොපැවැත් වූ කාලයේ, යම් වැසි දුප්පත් ගොවියාට සිදු වූයේ තමන්ගේ ද්‍රව්‍ය වෙළෙන්දන් ඉල්ලන ගණනකට ඔහේ දීලා දමා ලද දෙයින් සෑහ සී, පාඩු විඳ දරාගෙන හෝ නිකම් සිටීම යං නමුත් දැන් තත්වය එසේ නොවේ. ගොවියා අත්ත වශයෙන් ම යම් කිසි දෙයක් නිපදවූව හොත්, ඔහුට ඒ සඳහා නියමිත මුදලක් ලැබෙන බව ඔහු කල් තියාම, කිසිම අඩමානයක් නැතිව දන්නේ ය. එසින් ගොවියා ගොවිතැන් කිරීමට-උපදවීමට-නිපදවීමට ලැබෙන අනුබලය එසේ මෙසේ නොවේ. මේ අතින් තවත් විපුල සේවාවක් මහජනයාට සිදුකරණ "ගොවි ද්‍රව්‍ය නිපදවීමේ හා අලෙවිකිරීමේ සමූපකාර සමිතින්" මේ අමාත්‍යාංශයේ ම වැඩක් බව මෙහි ලා පළ කරන්නේ ප්‍රීතියෙනි.

හාල් පිටරටින් ලබා ගැනීමට මෙම අමාත්‍යාංශය දරන්නේ මහා "දුෂ්කර ක්‍රියාවකි" හාල් බහුලව ඉපදෙන බුරුමයේ සහ ඉන්දුචීනයේ අභ්‍යන්තර විශවුල් තවම එක හතක් වී නැති වීම, අපේ සහල් තත්වයට තරමක අනතුරක් වී තිබේ. එහෙසින් පිටරටින් අපට බලාපොරොත්තු විය හැකි සහල් ප්‍රමාණය තවමත් සීමාසහිත ය. එහෙත් ආහාර අමාත්‍යාංශය නිරන්තරයෙන් ම අවදිව සිටී නිසා සහල් තත්වය සතුටුදායක කරවා ගන්නට පුලුවන් වූ බව ඔබ විසින් මෙහිදී ඒත්තු ගත යුතු ය. තොග වශයෙන් ආහාර ගෙන්වීම ටිකෙන් ටික-අනුක්‍රමයෙන් සතුටු දායක වූ නමුත්, 1949 යේ දී, මුදල් හුවමාරු වටිනා කම් පහල යෑමේ හේතුවෙන්, ජීවන මිල ඉහල යාමත් සහල් සඳහා වැඩි මුදලක් නැප කරන්ට සිදුවීමත් නිසා, මෙදක් ඇණ හිටි බව පෙනේ. ලංකාව ද සම්බන්ධ ජාත්‍යන්තර කිරීගු ගිවිසුම නිසා පිටි වැඩියෙන් ලැබේ යයි බලාපොරොත්තු වූ නමුත් හුවමාරු මුදලේ වටිනාකම පහල බැසීම හේතු කොට ගෙන සිතූ තරම් ප්‍රයෝජනයක් ලබා ගන්ට බැරි විය. ඇත්ත වශයෙන්, පලමු පැවති පිටි මිලට වඩා ගිවිසුමෙන් පසු පිටි මිල හුඟක් වැඩි විය. එහෙත් ඒ මේ නොයෙක් කරදර හිරිහැර මධ්‍යයේත් මේ තරම්වත් සාධාරණ මිලට පිටි ලබා දීම ගැන මහජනයා ආහාර අමාත්‍යාංශයට කෘතඥ විය යුතුයි.

පසු ගිය වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුව මගින් මෙරටට ගෙන්වන ලද සහල් ප්‍රමාණය මෙසේ ය.

| | |
|---|---|
| හාල් ටොන් | 271000 |
| පිටි ටොන් | 79000 |
| සීනි ටොන් | 87000 |

මේ හාල් වලටත් පිටි වලටත් අප අපේ අතෙන් ගෙවන්නේ කීයක් වුවත්, මේ සඳහා අපේ ආණ්ඩුව දරණ වියදමේ විශාලත්වය ඔබට දැන් පැහැදිලි වී ඇත. තව තවත්, පුලුවන් තරමින් සහල් මිල පහත බැස්සීමත්, පිටි මිල පහත බැස්සීමත් මේ අමාත්‍යාංශයේ අරමුණයි. කොටින් ම, දැන් සීමා ක්‍රමයෙන් සහල් ඉවත් කර තිබේ. රට හාල් හෝ මෙරට සිංහල සහල් සත ගැට ගණනකට ඕනෑම තැනකින් ඔබට ලබා ගන්නට පුලුවනි. එසේ ම, සීනිත්, සුදු සීනිත්, ඔබට කැමති තැනකින් කැමති ප්‍රමාණයක් මිලදී ගන්ට පුලුවනි. යුද්ධ කාලයේ ආහාර කණ්ඩයත්, දැන් ආහාර තත්වයත් මදක් සමාන කර බලන්න. එදාට වඩා අද ඇති වෙනස ඔබට තේරේ නම්, මෙම අමාත්‍යාංශයෙන්, මෙම දෙපාර්තමේන්තුවෙන් කෙරුණු භාන්ඩ කමක් නැටියට එය තේරුම් ගන්නාට මරදක් නැත. ටිකින් ටික, අනුක්‍රමයෙන්, යුධ කාලයෙන් පෙර පැවැති තත්වයටම අපේ ආහාර තත්වය දියුණු කරලීම, නයින් බැස්සීම පිණිස වන් මාන ආණ්ඩුව දිවා රෑ වෙහෙසෙන බව මෙහි ලා පලකරනු කැමැත්තෙමි.

කිරි බෙදා දීම ගැන ඊළඟට කථා කරමු. අවුරුදු ගණනක් තිස්සේ රට පුරා කිරි මධ්‍යස්ථාන ගණනාවක් පිහිටුවා දරුවන්ගේ බඩ පුරා කිරි බෙදා දුන්නා සේ, දැනටත් එම කිරි දීමනාව එලෙසින් කර ගෙන එන බව කවුරුත් දන්නා කාරණයකි. එහෙත් එම කිරි දීමනා එදාටත් වඩා වැඩියෙන් අද කෙරෙන බව කවුරුත් නොදන්නා කාරණයක් වෙන්නට පුලුවනි. දැනට දිවයින පුරා විසිරී පවත්නා කිරි මධ්‍යස්ථාන ගණන තුන් දහස් පන් සියයකි. (3500) මේ ස්ථානවලින් දෙලක්ෂ පණස් දහසකටත් අධික මව්වරුත් දරුවනුත් දිනපතා කිරි බොන්නාහ. කවදත් පුරුදු සිරිත නම් කිරි දරුවන්ට කිරි දීම වුවද, වර්තමාන රජය මව්වරුන්ටත් කිරි පොවන්නේ ජාතියේ කොඳු ඇටය වූ කුඩා දරු පරම්පරාව හදන්නේ වඩන්නේ වාත්තු කරන්නේ මාතෘ පක්ෂය නිසා ය. තොටිල්ලය පදවන හස්තය එදා මෙන්ම අදත් ලෝකය පාලනය කරන නිසා ය. මේ කිරි දීමේ එක් විශේෂයක් පසු ගිය දිනවලදී අත්හදා බලන ලදී. එනම්, පිටරටින් ගෙන්වන කිරි වෙනුවට මෙරට කිරි දෙන්නට පුලුවන් දැයි බැලීමයි. කිරි සුලභ ප්‍රදේශවල ඇත්ත වශයෙන් ම මෙය ඉතා පහසුවෙන් කළ හැකි බව පරීක්ෂණයන්ගෙන්-අත්හදා බැලීම් මගින් හෙළි වී තිබීම ශුභාරංචියකි. මෙයින් යහපත් දෙයක් සිද්ධවෙයි. මෙරට ගව සම්පත දියුණු කර ගැනීමට අනුබල ලැබෙන පරිද්දෙන් මෙරට එළකිරි සරුලෙස අලෙවි වෙයි. ඒ අතරම රට කිරි සඳහා පිට රට ඇදී යන මුදල මෙහි ඉතිරි වෙයි. දැනට දිවයිනේ කිරි මධ්‍යස්ථාන 150 ක ම දෙනු ලබන්නේ මේ රට එළ කිරියි. සෙසු මධ්‍යස්ථාන වලටත් එළ කිරි සපයන්නට පුලුවන් වූ වහාම එසේ කරනු ලැබේ. 1948-1949 වර්ෂය තුළ ඔබේ ආණ්ඩුව මේ ඉතා වැදගත් ජාතික කිරි දීමනාව සඳහා පමණක් රුපියල් තිස් හතර ලක්ෂ හතලිස් හතර දහස් පන්සියයක් (34,44,50,00) වියදම් කර තිබේ.

—/o/—